ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 අහිතකර විගණන මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක පීඊඩී 54 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය විසින් උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

**1.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2008 ජුනි මාසයේදී බඳවා ගන්නා ලද නිලධාරියකුට අදාළ, සේවක භාරකාර අරමුදල් දායකය හා සේවක අර්ථ සාධක අරමුදල් දායකය පිළිවෙලින් රු.10,200 ක් හා රු.68,000 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ආ) සේවක අර්ථ සාධක අරමුදලේ හිඟ දායක මුදල් සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කිරීමෙන් තොරව සේවක ණයවලින් නිරවුල් කිරීම හේතු කොට ගෙන

ගිණුම්වල දැක්වෙන රු.36,800 ක සේවක ණය රු.27,200 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) අවසාන තොගය සාවද්‍යව අගය කිරීම හේතු කොට ගෙන රු.104,432 ක් වූ අවසාන තොගය රු.52,216 කින් වැඩියෙන් දක්වා තිබුණි. එබැවින් වර්ෂය සඳහා ජංගම වත්කම් හා ලාභය එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අදාළ ලේඛන, තොග සමීක්ෂණ වාර්තා, ණය ඉල්ලුම් පත්‍ර ආදිය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.383,960 හා රු.66,000 ක් වූ පිළිවෙලින් අවසාන තොගය හා සේවක ණය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනතේ උපලේඛන ඒ (5)(2) | පසුගිය වර්ෂ දෙකක් සඳහා සාමාජික මුදල් නොගෙවන ලද සාමාජිකයන් 7 දෙනෙකුගේ සාමාජිකත්වය අවලංගු කිරීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.347,662 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.378,302 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.30,640 කින් අඩුවීමක් දැක්වුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී වියදමේ වැඩිවීම ආදායමේ වැඩිවීම ඉක්මවා තිබීම එයට හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් ප්‍රතිඵල**

**3.1 කාර්ය සාධන සමාලෝචනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 සැප්තැම්බර් 24 දින පවත්වන ලද සභා රැස්වීමට අනුව, යහසාධක අරමුදලේ ජංගම ගිණුමෙන් රු.250,000 ක මුදලක් බැංකුවක ස්ථාවර තැන්පතුවකට මාරු කිරීම සඳහා සභාව විසින් තීරණය කර තිබුණි. කෙසේ වුවද මෙම තීරණය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.

**(ආ) ප්‍රධාන අරමුණු ප්‍රමාණවත්ව ක්‍රියාත්මක නොකිරීම**

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනතේ 04 වගන්තියේ සඳහන් පරිදි පහත සඳහන් ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

i. පුස්තකාල ස්ථාපිත කර පවත්වා ගෙන යාම මඟින් තක්සේරු විද්‍යාව සම්බන්ධයෙන් හෝ සම්බන්ධිත අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හා දැනුම හුවමාරුව ප්‍රවර්ධනය කිරීමට

ii. ආයතනයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් විභාගයන් පැවැත්වීම හෝ සපයාදීම සහ එම විභාගයන් සඳහා අධ්‍යයන පාඨමාලා සැපයීම හෝ අනුමත කිරීම සහ දේශකවරු හා විභාග පරීක්ෂකවරු යොදා ගැනීම හා පාරිශ්‍රමික ගෙවීමට

iii. ශිෂ්‍යත්ව, ප්‍රදර්ශන, ශිෂ්‍යාධාර හා පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීමට

iv. ශ්‍රී ලංකාවේ තක්සේරු වෘත්තියෙහි යෙදෙන්නන්ගේ ප්‍රතිලාභ හෝ වර්ධනයන් සඳහා අවශ්‍ය පරිදි දත්ත බැංකු ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම ඇතුළත් වෙනත් එවැනි ක්‍රියාමාර්ග ගැනීම සඳහා

(ඈ) 2010 දෙසැම්බර් 06 දින පවත්වන ලද සභා රැස්වීමට අනුව, ( 15 වන සැසියේ පළමු රැස්වීම ) අවම වශයෙන් මාස තුනකට වරක් සම්මන්ත්‍රණ පැවැත්වීමට තීරණය කර තිබුණි. එසේ වුවද ආයතනය විසින් 2012 වර්ෂය සඳහා එක් සම්මන්ත්‍රණයක් පමණක් පවත්වා තිබුණි.

**3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------------

රු.71,190 ක් හා රු.186,830 ක් වූ පිළිවෙලින් චලනය නොවන හා සෙමින් චලනය වන විෂයයන් 2012 දෙසැම්බර් 31 දිනට තොගයේ ඇතුළත්ව තිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

-------------------------------------------

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව, මුදල් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2012 වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජනවාරි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරික්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මඟින් සභාපතිගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) සාමාජික ගාස්තු රැස්කිරීම

(ඇ) මූල්‍ය කළමනාකරණය

(ඈ) ස්ථාවර වත්කම් පාලනය

(ඉ) අයවැය පාලන